වෙලාව උදේ අටකුත් විනාඩි පහළොවක් පමණ විය.
නාරද තෙරණුවෝ බෝධියත් බුදු මැදුරත් යා කරන වැලි මළුව දිගේ සක්මන් කරමින් අරුණ නැගෙන්නට පෙර කියවූ මාක්ස්ගේ ලූයී බොනපාට් පිළිබඳ විග්‍රහය තේරුම් බේරුම් කර ගන්නට උත්සාහ දරමින් සිටියහ. බලය නැමති සාධකය විසින් මිනිස් මනස තුළ ඇති කරනු ලබන ව්‍යාධියත් එහි ප්‍රතිඵල මගින් මුළු මහත් සමාජයක් පීඩාවට පත් වෙන අයුරුත් පුදුම සහගතය. රාජ්‍යය විසින් පොඩි පට්ටම් කර දමන ලද අරගලය ඉතිහාසයේ අහම්බයක් නොව, මේ උමතු බල අධිකාරීත්වයට එරෙහිව පැන නැගිය යුතුව තිබුණු අනිවාර්යයකැයි උන් වහන්සේ කල්පනා කළ සේක. නිෂ්ක්‍රීයතාවය තුළ සියල්ල ගිලෙමින් පවත්නා අවකාශයක තව දුරටත් "මම" යනු කෙබඳු දෙයක්දැයි සිතන්නට උන් වහන්සේට උවමනා විය. බෝ මළුවේ මලසුනේ පෙරේදා හින්නි අම්මා පූජා කළ පරවුණු අරලිය මල් තුනක් තිබෙනු පෙනේ. ඉඳ හිට හෝ පන්සලට මලක් පූජා කරන්නට එන්නේ ඈ පමණය.

චාදු තාත්තා

බුදු මැදුරට උඩින් අල්ලපු වත්තේ පිපුණු තල මල අපූරුවට පෙනෙයි. තල මලක් පිපෙන්නේ කාලාන්තරයකට සැරයකි. එහි සිටි ඇටිකුකුළෙකු වේගයෙන් පාත් වී බුදු මැදුර ළඟ මල් පාත්තියේ සිටි ගොළුබෙල්ලෙකු ඩැහැ ගෙන නැවත ඉගිලී ගියේය. උදේ පිත්නෙන් නාරද හිමියන්ගේ නැහැය බර වී තිබිණ.
"චාදු තාත්තේ.."
ජංගිය අතේ උණ්ඩි කරගෙන උංගි හෙළුවෙන් ආවාසය පැත්තේ සිට පඩි පෙළ නැග ගෙන එයි.
"චාදු තාත්තේ.. කක්කා.. කක්කා.."
නාරද හිමියෝ උංගිව අතකින් අල්ලා ගෙන පහළ ළිඳ ළඟට එක්කර ගෙන ගොස් උංගිගේ කක්කා හේදූහ. දුවන්නට හදන උංගි අල්ලාගෙන ජංගිය ඇන්දවූහ.
උංගි ගලක් ගෙන පියදාස පස්සේ එළවන්නට විය. පියදාස පන්සල සතු වංචල දේපළක් බවට පත් වුනේ අවුරුද්දකට පෙරය. පන්සලේ ගේට්ටුව ළඟ දමා ගොස් සිටියදී නාරද තෙරණුවන් විසින් වඩා ගෙනවිත් ලොකු හාමුදුරුවන්ට හොරෙන් ආවාසේ පිළිකන්නේ තියා ගෙන ලොකු මහත් කරගත් පියදාසට කිසිදා සුව නොවෙන කුෂ්ටයක් සෑදී තිබේ. ලේ පොක්කලන් එන තුරුම කුෂ්ටය කැසීමට ශක්තිය යෙදවීම හන්දා පියදාස දැන් ඇටෙයි හමයි විතරය.
"චාදු තාත්තේ.. බවුවා..බවුවා"
උංගි චාදු තාත්තේ කියන හැම වචනවකම නාරද තෙරණුවන්ගේ හිත කිරි ගැහෙයි. උංගි පන්සලට සින්න වී සතියක් ගත වී ඇතත් තවමත් ඒ ආමන්ත්‍රණය නාරද තෙරණුවන් පෙලයි. හාමුදුරුවන්ට එසේ නොකියන ලෙසත් - කීවොත් අපායේ යන බවත් උංගිගේ ඔළුව අත ගාමින් කී ලොකු හාමුදුරුවන්ට දැන් උංගි කියන්නේ චාදු වියා කියාය. ලොකු හාමුදුරුවෝ කොන්දේ අමාරුව හන්දා ඇඳට වැටී දැන් මාස තුනකටත් වැඩිය.
පියදාස පස්සේ කොර ගහමින් එළවා ඇති වුණු උංගි දුවගෙන ඇවිත් තෙරණුවන්ගේ සිවුරේ එල්ලුණේය. පොඩ්ඩාට උදෙන්ම බඩගිනිවෙන බව නාරද තෙරණුවෝ දනිති. උංගිගේ නහය මිරිකා එළියට එන්නට දඟලන හොටු දල්ල අයින් කළ නාරද තෙරණුවෝ උංගිව වඩා ගෙන ආවාසයට ඇතුළු වුණහ. දිගෙන් දිගටම පනවා තිබූ ඇඳිරි නීතිය නිසාත් ගමේ බොහෝ දායකයෝ වෙඉගවෙරාරාගමයට දන් එවීම නවත්වා තිබූ නිසාත් බණ්ඩයියාට බතක් මාළුවක් ඒදන්නට සිදු වී තිබිණ. නාරද තෙරණුවෝ උංගිව ඔඩොක්කුවට ගෙන බතුත් පොල් සම්බෝලයත් අනා කවන ගමන් සෝපාකගේ කතන්දරය කියා දුන්හ. උංගිට සෝපාකගේ කතාව තේරුණේම නැත. උංගි ඔඩොක්කුවෙන් පැන දුව ගොස් කටේ හිර කර ගෙන උන් බත් ගුලිය බිම දැම්මේය. පියදාස ඒ බත් ගුලිය බිමට වැටෙන්නටත් කලියෙන් ඩැහැගත්තේය. කිසිවෙකු එන බව දැක පියදාස බුරා හැලෙන්නට විය.

"හාමුදුරුවනේ."
ආවාසයට එක වරම ඇතුළු වූ තරුණයා මින් පෙර නොදුටුවෙකි.
"මං තිස්ස- දෙවුන්දරිං හාමුදුරුවනේ. පෙරේදා රෑයි වීරවිල ඉඳං ආවෙ."
"රහස් වචනය කියන්න සහෝදරයා."
"රස්පුටින්"
"උන් පිස්සු බල්ලො වගේ පස්සෙන් එළෝනවා හාමුදුරුවනේ. දෙපාරක් සර්ච් කෙරුව රෑ හන්දා බේරිල ආවා."
"බණ්ඩයියෙ මේ මහත්තයටත් එක්ක තව හාල් කාලක් ලිපේ තියන්ඩ."
"මේං මේ ලියමන දෙන්ඩ කිවුව සනත් සහෝදරය- ඒ සහෝදරයා ඔබ වහන්සෙ එක්ක රුහුණෙ එක බැජ් එකේ හිටිය කිවුවා."
උංගි බිම ඉඳගෙන තිස්සගේ නියපොතු අත ගා බලන්නට විය. බණ්ඩයියා කුරු කුරු ගාමින් හාල් කැටයක් නැඹිලියට දමා ගරමින් තිස්සට රැවුවේය. නාරද තෙරණුවන්ගේ වැඩ හන්දා තමන්ටත් පන්සලටත් නුදුරේදීම සිදුවන මහත් විනාශය බණ්ඩයියාට ඉව වැටී තිබිණ. පොත් ගුලේ ඇතුළු කාමරයේ පෙට්ටියක දමා හංගා තිබූ රතු පාට පොත් බණ්ඩයියා තුළ ඇති කළේ මහත් බියකි. ඒ පොත් ඇතුළේ සිරගතව සිටි ලොකු රැවුල් වවාගත් අංගුලිමාලලා හැමදාම රාත්‍රියට එළියට පැමිණ බණ්ඩයියාගේ හීන වලට ඇතුළු වී ඔහුව බය කරති.

"හාමුදුරුවනේ මේ දරුවා කාගෙද?"
උංගි තිස්ස දිහා බිම ඉඳගෙන බලාගෙන හිටියේය. තිස්සගේ මූණේ උංගිට නරඹන්නට බොහෝ දේ තිබිණ.
"ධර්මෙගෙ- මේ ළමයත් අරං ගිය අප්පේල් පළවෙනිදා මහ රෑ ධර්මෙ ආව. ධර්මසිංහ ගමාරච්චි- ඌරගහ. දන්නවද?"
"දන්නව හාමුදුරුවනේ."
"දරුවගෙ අම්ම නැති වෙලා තියෙන්නෙ දරුවා උපං දාමයි. මන්ද බුද්ධික හන්දා කවුරුත් ළමය බලා ගන්න කැමති නැලු. ධර්මෙ ගියා දරුව දාල- ඇල්පිටිය පොලීසියට පහර දුන්නු කණ්ඩායමේ ධර්මෙත් හිටිය. ඔය සහෝදරයා ධර්මෙ ගැන මොකුත් ආරංචියක් දන්නවද?"
"දන්නව හාමුදුරුවනේ."
තිස්ස උංගිව ඔඩොක්කුවට ගෙන ඔළුව අත ගෑවේය.
"මාමි මාමි"
උංගි තිස්සගේ රැවුල අත ගා බලන්නට පටන් ගත්තේය.
"ඒ ඇටැක් එක වැරදුනා හාමුදුරුවනේ. ඊට පස්සෙ ඇල්පිටියෙයි ඌරගහයි කණ්ඩායම් බටපොලට එකතුවෙලා සිංහරාජෙ පැත්තට පනු බැස්සා. ආමි එක දිගටම පහර දීල තියනවා. අන්තිමේදි සීයක විතර කාණ්ඩෙකිං ඉතුරු වෙලා කැලේට රිංගගෙන තියෙන්නෙ හතළිහක් විතරයි. ධර්මෙ මැරිල තියෙන්නෙ පළවෙනි පහර දීමෙදිමයි හාමුදුරුවනේ. මට වීරවිලදි ආරංචි උනේ."
නාරද තෙරණුවෝ දිග සුසුමක් හෙළූහ.
උංගි තිස්සගේ රැවුලෙන් අදින්නට වූ හන්දා හාමුදුරුවෝ උංගිව අතට ගෙන පහළ දෙණිය පැත්තට අවිද ගියහ. උංගි තෙරණුවන්ව කොනිත්තමින් බිමට බහින්නට දැඟළුවේය. පහළ වෙල්ලාවේ ඈත ගුණයා සහ ගුණයාගේ ලොකු කෙල්ල සුද්දී වැඩ කරනු නාරද හිමියන්ට

තරංග ජයසේන
koombiyaonline@yahoo.com

පෙනේ. වෙල්ලාවේ හැම රෙදි වැලක්ම මළගෙදරක යන්නට මෙන් සුදු රෙදිවලින් සැරසී උන්හ.
තෙරණුවන් අඬන බව උංගිට තේරුණේ නැත. උංගි ගහක පිපී තිබුණු සුදු මුස්සැන්ද මලක් කඩා එය අතින් පොඩි කර දැම්මේය. නාරද තෙරණුවෝ සිවුරු කොණකින් කඳුළු පිස දැමූහ. ධර්මේ හමු වූ මුල් දිනය තෙරණුවන්ට අද මෙන් මතකය. ධර්මේ හොඳ හිතක් තිබූ, ව්‍යාපාරය වෙනුවෙන් සියල්ල කැප කළ, නායක සහෝදරයාගෙන් පවා දක්ෂ, නිර්මල කාඩර්වරයෙකුයැයි යන හැඳින්වීම දිනුවෙකි. පංති පහ ඉගැන්වීමට ධර්මේ තරම් සමතෙකු නොසිටි තරමිය. ඔහුගේ ආකර්ශනීය වාග් චාතුර්යය මගින් ව්‍යාපාරයට කී දෙනෙකු දිනා දුන්නේද?
එදා රෑ උංගි පන්සලේ දමා සමු ගනිද්දී ධර්මේ කියූ වදන් තෙරණුවන්ගේ සවනෙහි දෝංකාර දෙන්නාක් වැන්න.
"හාමුදුරුවනේ, මං යනවා- මං ආයෙ එනකල් මගෙ කොල්ලව බලාගන්න - මං මගෙ හිත ඌ ගාව දාල යන්නේ."

ඒ හිත විතරක් උංගිට ඉතුරු කොට ධර්මේ ගිහිල්ලාය. ගුණයා එකම එක රතු රෙද්දක් වෙල්ලා හැලියෙන් ගෙන වතුර බේරෙන සේ මිරිකා සුදු රෙදි වැලේ ඉතිරි වී තිබූ එකම ඉඩෙහි වැනුවේය. දෙණියේ බෑඳ හුන් එළදෙනක පැටියාට කෑ ගැවාය. නාරද තෙරණුවෝ තිස්සට කන්න දෙන්නට මතක් වූ හන්දා ආයෙමත් ආවාසය දෙසට පියමං කළහ.

(****)

එදා රෑ දොළහට පමණ නාරද තෙරණුවෝ උංගිගේ අහකට වී තිබුණු පොරෝනය සකසා,



සිතුවම - සුනිල් ශාන්ත අමරසෝම

නින්ද ගොස් සිටි තිස්සව ඇහැරවාගෙන බුදු මැදුරට ගියහ. දොර වසා, එළිය අඩු කරන ලද කුප්පි ලාම්පුව මලසුන මත තැබූ තෙරණුවෝ තිස්සගේ රැවුලද කොණඩයද බූ ගැහ. තිස්සට කුප්පි ලාම්පුවේ දුබල ආලෝකයෙන් බුදු පිළිමයේ විතරාගී මුව මඩල පෙණින. උන් වහන්සේගේ මඳහසෙහි අනුකම්පාවක් ගැබ්ව ඇතැයි තිස්සට හිතුණේය. පිළිම වහන්සේ තමන්ට සුපුරුදු මේ දසුන දහ හතර වෙනි වතාවට ඉවසා වදාළ සේක. නාරද තෙරණුවෝ තිස්සට අඳනකඩ සිවුරු ඇන්දවූහ. ඉන්පසු නාරද තෙරණුවෝ පහත් හඬින් තිස්සට පන්සිල් දුන්හ. තිස්ස හඬ නොනගා හිතෙන් පන්සිල් ගත්තේය. ඉතිපිසෝ ආදී ගාථාද සජ්ඣායනයෙන් පසු තිස්ස නාරද තෙරණුවන්ගේ දෙපා සිඹ වැන්දේය.
"තිස්ස, ඉක්මනින් පිට වෙන්න ඕන. එළිය වැටෙන්න කළින්."
ඉන්පසු දෙදෙනාම නැවත ආවාසයට පැමිණ උංගි නිදා හුන් ඇතුළු කාමරයට වැදුනහ. නාරද තෙරණුවෝ තිස්සට සිවුර අඳින හැටි කියා දුන්හ. සැකකාර හික්ෂුවක් හසු කර ගැනීමට පහසුම ක්‍රමය සිවුර කඩා නැවත අඳින්නට කීමය. තිස්ස දහ පහළොස් වතාවක් නැවත නැවත සිවුර කඩමින් ඇඳ පුරුදු විය. විශ්ව විද්‍යාලයේදී පාලි විෂයයක් ලෙස හැදෑරූ තිස්සට ගාථා සහ සූත්‍ර දේශනා කට පාඩම් තිබීම නාරද හිමියන්ට පහසුවක්ම විය.
එළිවෙන්නට පැය හතරක් තිබියදී තිස්ස පන්සලෙන් පිටවිය. වටාපතක් ද කළු කුඩයක් ද ගත් අළුත් හාමුදුරුවෝ එළඹෙන මරණයේ අඳුර අතරේ නොපෙනී යනු නාරද තෙරණුවෝ සඳ එළියෙන් බලා උන්හ. රැහැයියන් තොර තෝංචියක් නැතිව ළතෝනි දුන්නෝය. නාරද තෙරණුවෝ රැහැයියන්ටම රැය භාර දී නිදිමත ඇස් පිස දමමින් කුටියට පිවිසුණහ.
උංගිගේ පොරෝණය ඇඳෙන් බිමට වැටී තිබිණ. නාරද තෙරණුවෝ එය ගෙන පොරවා උංගිගේ ළඟින් ඇල වූහ. නාරද තෙරණුවන්ගේ කම්මුල් වලට උංගිගේ හුස්ම වැදිණ. උංගි චාදු තාත්තේයි කියන කොට ඇතිවන ආකාරයේම තිගැස්මක් නාරද හිමියන්ට දැනුණේය. ඒ තිගැස්ම ආදරයේත් අනුකම්පාවේත් එකතුවෙන් සෑදි කිසිවක් බව උන් වහන්සේ දැන සිටියහ.
උංගිගේ සිඟිති පපු පෙදෙස රිද්මයකට මෙන් සෙලවෙමින් තිබිණ. නාරද තෙරණුවෝ උංගිගේ පපුවට අත තබා බැලූහ. නාරද තෙරණුවන් තමන් මරණය හිසින් දරා ගෙන සිටින බව නොදන්නේ නොවේ. නමුත්, ඉන් සැඟවීමට උන්වහන්සේ විශේෂ කිසිවක් නොකළහ. නුදුරේ දිනෙක පන්සලේ දොරෙන් මරණය ඇතුළු වෙන බව උන්වහන්සේ දනිති. එහෙත් උංගි, කිසිවෙකුත් නැතිව අසරණවූ දරුවා සතියක් ඇතුළත නාරද තෙරණුවන්ව වෙනස් කොට තිබිණ. චාදු තාත්තාට හැර යා නොහැකි කිසිවක් උංගි පුතා ළඟ තිබුණාක් වැන්න. නාරද තෙරණුවෝ උංගි තුරුළු කොට ගෙන උංගිගේ සිඟිති කම්මුල් ඉම්බෙය. වැඩි වෙලාවක් ගත නොවී නාරද තෙරණුවෝ නින්දට වන්හ. උංගි උන්වහන්සේගේ නිරුවත් පපුව අස්සේ උණුහුමට ගුලි වූ පූසි පැටවෙකු බවට පත් විය.

(****)

චාදු තාත්තාට විශාල කාලයක් ඉතිරිව නොතිබිණ. එළිවෙන්නට පැය තුනක් තිබියදී මරණය ට්‍රක් රථයක නැගී පන්සලට කඩා වැදින. මහ හඬින් කෑ ගැසූ තිරිංග විසින් නාරද තෙරණුවන්ව ඇහැරවන ලදී. පියදාස මුළු ශක්තියම යොදා බූරා හැලුණේය. හමුදාවේ අය ආවාස ගෙට එන්නට කලින් නාරද තෙරණුවෝ පඩි පෙළ නැග ආහ.

ඉනික්බිති,
උංගි නිදියන් හිටියේය.
චාදු තාත්තා බරුම් එකකින් ගමනක් යමින් හිටියේය.
පියදාස ළතෝනි දී හති වැටී සෙමෙන් සෙමෙන් කුෂ්ටය ලෙව කා ගනිමින් වැතිරී උන්නේය.

(****)

වෙලාව උදේ අටකුත් විනාඩි පහළොවක් පමණ විය. නාරද තෙරණුවන්ගේ ජීවිතයේ අපවත් නොකරන ලද ශේෂය සීතල සිමෙන්ති පොළව මත දිගේලි කොට තිබිණ. සිහිය එන විට තමන්ගේ අත පය ගැලවී ඇතැයි උන් වහන්සේට සිතිණ. යටි බඩෙන් පැන නැගී ආමාශය හරහා පපු කුහරය ද හාරවා ගෙන මතු වූ වේදනාව ලේ ගුලියක් කොට වමනය දැමූ නාරද තෙරණුවෝ පාන්දර ජාමයේ තමන්ගෙන් දන්නවාදැයි ඇසූ සංවිධානයේ සහෝදරයන්ගේ නම් මතකයට නගා ගන්නට වැයම් කළහ. ඉන් එකදු නමක් හෝ උන්වහන්සේට සිහියට නගා ගත නොහැකි වුණි. තව දුරටත් ඉතිරිව තිබූ සිහි කල්පනාව ප්‍රමාණවත් වූයේ එකම එක නමක් සිහියට නගා ගැනීමට පමණි.

ඒ මොහොතේ ඒ නමේ අයිතිකාරයා ජංගිය අතේ උණ්ඩි කරගෙන හෙළුවෙන් ආවාසය පැත්තේ සිට පඩි පෙළ නැග ගෙන බෝ මළුව පැත්තට ඇවිදගන ආවේය.

"චාදු තාත්තේ.. කක්කා.. කක්කා.."